ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2020 මැයි මස 06 දින** |

## ආර්ථික ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කරයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2020 මැයි 06 වැනි දින පැවැති විශේෂ රැස්වීමේදී වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමාලෝචනය කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 5.50 සහ සියයට 6.50 දක්වා පදනම් අංක 50කින් 2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි අඩු කිරීමට තීරණය කළේය. උද්ධමන පීඩන අඩුවෙන් පවතින වාතාවරණයක් තුළ, කොවිඩ්-19 වසංගතය හේතුකොටගෙන ඇතිවන අහිතකර ආර්ථික බලපෑම්වලට මුහුණ දීම සඳහා ආර්ථිකයට තවදුරටත් සහාය වීමේ ඇති අවශ්‍යතාව සලකා බලමින් මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹුණි. මෙම තීරණයත් සමඟ, මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා ගන්නා ලද අනෙකුත් ක්‍රියාමාර්ගවලට අමතරව, 2020 වසරේ මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 150කින් අඩු කර ඇත.

වසර තුළ මේ දක්වා කාලය තුළ මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ට අනුකූලව වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ

ගොස් නැති බව මුදල් මණ්ඩලය විසින් කණස්සල්ලෙන් යුතුව නිරීක්ෂණය කරන ලදී. එමනිසා, තවදුරටත් ප්‍රමාදයකින් තොරව ණය අනුපාතික අඩු කරන ලෙස මූල්‍ය ආයතනවලින් දැඩිව ඉල්ලා සිටින අතර, එසේ නොවුනහොත්, වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ දැමීම සඳහා සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු වනු ඇත.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් අඩු කරන ලදී.** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | 5.50% |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | 6.50% |
| බැංකු අනුපාතිකය | 9.50% |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | 4.00% (නොවෙනස්ව පවතී) |

**සටහන:** *පෙර නියමිතව තිබූ පරිදි 2020 මැයි 21 දින මුදල් ප්‍රතිපත්ති නිවේදනයක් සිදු නොවේ. කෙසේ වෙතත්, ආර්ථික සහ වෙළඳපොළ වර්ධනයන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය වන පරිදි මුදල් මණ්ඩලය විසින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය වෙනස්කම් කිරීම සිදු කරනු ඇත.*